// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2368/23 - 2024 ජනවාරි මස 24 වැනි බදාදා - 2024.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: BD/LG/LND/2/9/4.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 4-3/8/2016/PC/205.

බ/මිල්ලබැද්ද විද්‍යාලයට අවශ්‍ය ක්‍රීඩා පිටියක් ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:

**කැබලි අංක 1 - ඉඩමේ නම - හොප්ටන් වත්ත - ප්‍රමාණය: හෙක්. 0.4535ක් පමණ.**

*උතුරට*: මිල්ලබැද්ද කොටසක් (ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් හිමිකම් කියන හොප්ටන් වත්ත, මාර්ගය සහ එම්. යෝගනාදන් හිමිකම් කියන හොප්ටන් වත්ත); *නැගෙනහිරට*: මිල්ලබැද්ද කොටසක් (එම්. යෝගනාදන් සහ ඩී.එම්. කරුණාරත්න හිමිකම් කියන හොප්ටන් වත්ත); *දකුණට*: මිල්ලබැද්ද කොටසක් (එම්. යෝගනාදන් සහ ඩී.එම්. කරුණාරත්න හිමිකම් කියන හොප්ටන් වත්ත) මු.පි.බ. 686හි කැබලි අංක 11,1 සහ කැබලි අංක 2; *බස්නාහිරට*: මු.පි.බ. 686හි කැබලි අංක 11,1 සහ කැබලි අංක 2 මු.පි. 2031 හි කැබලි අංක 2 සහ මිල්ලබැද්ද කොටසක් (ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් හිමිකම් කියන හොප්ටන් වත්ත).

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024.03.25 වැනි දින පෙ.ව. 9.00 ට ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2024.03.11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය.

නිරෝෂා චාන්දනී හෙන්නායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගල.

2024 ජනවාරි මස 22 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01 - 0210

1A - G 41316 - 24 (2024/01)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*